Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2011** PUBLIC EXAMINATION

# Sinhala

## Continuers Level

**Monday 24 October: 2 p.m. Eastern Standard Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 50 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 50 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

© *Victorian Curriculum and Assessment Authority 2011*

**Part A** (Questions 1–4)
(20 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear FOUR texts. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks** | You may make notes in this space.

**Text 1**

1. (a) Why have surveillance cameras been set up in Colombo? Provide two reasons. **2**

______________________________

______________________________

______________________________

(b) What advice has been given by the Inspector General? **1**

______________________________

______________________________

**Text 2**

2. (a) What service has been introduced recently by Air Lanka? **1**

______________________________

(b) Identify the information in the advertisement that would attract the attention of the listeners. **2**

______________________________

______________________________

______________________________

______________________________

Marks

You may make notes in this space.

**Text 3**

3. (a) What is Shan's invitation **and** why does Tharu refuse it? **2**

(b) Explain how Tharu convinced Shan that her parents are very caring. **4**

(c) What suggestion did Shan make at the conclusion of their conversation? **1**

Marks | You may make notes in this space.

**Text 4**

4. (a) What evidence did Mr Watawala put forward to prove that there has been a boom in tourism? **1**

(b) How does Mr Watawala explain the reasons for the boom in tourism? **3**

(c) According to Mr Watawala, how is the tourist industry meeting the increase in demand? **3**

**Part B** (Questions 5–6)
(10 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information;*
- *convey the information accurately and appropriately.*

---

You will hear TWO texts, one relating to Question 5 and one relating to Question 6. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks** | You may make notes in this space.

**Text 5**

5. (a) Explain how the mother tried to show that eating rice has more advantages than eating bread. **2**

බත් අනුභව කිරීම පාන් අනුභව කිරීමට වඩා වාසිදායක බව පෙන්වීමට මව විසින් ගත් උත්සාහය විස්තර කරන්න.

________________________________

________________________________

________________________________

(b) ‘The products of one’s own country are the best.’ Explain this statement in relation to the text. **2**

“සිය රට දේ සිරි සැපදේ.” මෙම කියමන ඉහත කතාබහට අදාළව සම්බන්ධ කළ හැකි අන්දම පැහැදිළි කරන්න.

________________________________

________________________________

________________________________

Marks | You may make notes in this space.

**Text 6**

6. (a) Describe fully the most important strategies the speaker has used to achieve his academic success. **2**

තම අධ්‍යාපන සාර්ථකත්වය සඳහා කථිකයා යොදාගත් වඩාත් වැදගත් ක්‍රියා මාර්ග සම්පූර්ණයෙන් විස්තර කරන්න.

______________________________

______________________________

______________________________

(b) Explain why the speaker said that his success was the result of a combined effort. **3**

කථිකයා තම ජයග්‍රහණය සාමුහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස හැඳින්වුයේ මන්දැයි විස්තර කරන්න.

______________________________

______________________________

______________________________

______________________________

(c) What was the final piece of advice that the speaker gave to his audience? **1**

තම අසන්නන් වෙත කථිකයා දුන් අවසාන අවවාදය කුමක්ද?

______________________________

**End of Section 1**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2011 PUBLIC EXAMINATION**

# Sinhala

## Continuers Level

### Section 2: Reading and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 15 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in blue or black ink or ball-point pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

© *Victorian Curriculum and Assessment Authority 2011*

**Part A** (Questions 7–8)
(20 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and/or specific aspects of texts, by, for example, comparing, contrasting, summarising, or evaluating, and convey the information accurately and appropriately.*

---

7. Read the text and then answer in ENGLISH the questions that follow.

**ඉතිහාසය යළි මතුවේ**

**විශ්ව සුබසිංහ**

තව නොබෝ දිනකින් හම්බන්තොට වරාය පළමු සංවත්සරය සැමරීමට සැරසෙයි. ශත වර්ෂ ගණනාවක් මතකයෙන් බැහැරව තිබු ප්‍රදේශයක් කෙටි කාලයකදී ඉතා දියුණු වූ ප්‍රදේශයක් බවට පත්ව ඇත. ඉන්දියන් සාගරයේ පෙර අපර දිග ප්‍රධාන නැව් මාර්ගයේ මෙම වරාය පිහිටීම විශාල වාසියකි. මේ මාර්ගයේ ගමන් කරන නැව් නැවැත්වීම, අළුත්වැඩියා කිරීම, ඉන්ධන සැපයීම, සහ වෛද්‍ය පහසුකම් සැපයීම මඟින් ශ්‍රී ලංකාව විදේශ විනිමය උපයයි. ප්‍රදේශයේ අවශ්‍යතාවයන් අපනයනය සහ ආනයනය කිරීම මෙම වරායෙන් කෙලින්ම සිදුවන බැවින් ගිනිකොණ ප්‍රදේශයට ද්‍රව්‍ය ප්‍රවාහන වියදම ද අඩුවී ඇත. වරාය අවට ප්‍රදේශය බදු රහිත කලාපයක් ලෙස නම් කිරීම නිසා විදේශ ආයෝජකයන්ගේ දැඩි අවධානයට ලක්වී තිබේ. මෙයින් 50,000 කට පමණ රැකියා ද ලැබී ඇත. ප්‍රදේශය පුරා යටිතල පහසුකම් වැඩි දියුණුවීම නිසා ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් ද සිදුවී ඇත.

මේ සෞභාග්‍යය මීට අවුරුදු 2250 කට පෙරත් මෙම ප්‍රදේශයේම පැවති බව ඔබ දන්නෙහිද? ගොඩවාය නමින් හැඳින්වු පැරණි වරායක් මීට තරමක් බටහිරින් තිබූ බව ඔප්පු කිරීමට සාක්ෂි ඇත. එම වරාය ද, සේද මුහුදු මාවතේ වැදගත් නැවතුම් පොළක් වූවා විය හැක. එය ටොලමිගේ ලෝක සිතියමේ පවා ලකුණු කර තිබීමත්, ඒ අසල පිහිටි විහාරස්ථානයකින් හමුවූ, ‘ගජබා රජු විසින් ගොඩවාය වරායෙන් ලැබු සියලු ආදායම මෙම විහාර ස්ථානයට පූජා කරන ලදී’ යන්න සඳහන් සෙල් ලිපියත් මෙයට ප්‍රබල සාක්ෂි වේ. තවද, පුරාවිද්‍යා කැණීම් වලින් වරායකට අයත් ගොඩනැගිලි කොටස් ද, සිංහ ලකුණ සහිත මැටි රේගු මුද්‍රා ද, ගල් නැංගුරමක් ද සොයා ගෙන තිබේ. කිමිදුම්කරුවන්ට මුහුදු පත්ලේ තබී නැව් සැකිල්ලක් ද, චීන සහ පර්සියන් පිඟන් හා මැටි භාජන කොටස් ද ලැබී ඇත. මේ ප්‍රදේශයේ ගම් වැසියන්ට චීන, රෝම සහ ග්‍රීක පුරාණ කාසි ද හමුවී ඇත.

පැරණි ඉතිහාසය මතු වූ එකම අවස්ථාව මෙය නොවේ. මහවැලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අවස්ථාවේ, මාදුරු ඔය වේල්ල ඉදිකරන විටදී ද මීට අවුරුදු දහස් ගණනක් පැරණි වේල්ලක් එම ස්ථානයෙන්ම මතුවිය. පුදුමයි නේද?

QUESTIONS

| | | Marks |
|---|---|---|
| (a) | List four ways in which the Hambantota Port has helped the economy of Sri Lanka. | 4 |
| (b) | List four important pieces of evidence which prove that there was an earlier port in this area. | 4 |
| (c) | Explain how the title of the article is connected to the content. | 2 |

8. Read the text and then answer in ENGLISH the questions that follow.

**අපේ උරුමයන් රැකීම**

**වාර්තාකරු රුවන් ගුණසිංහ**

යුනෙස්කෝව, 2010 වර්ෂයේදී හෝර්ටන් තැන්න, ශ්‍රී පාදය සහ නකල්ස් වන අඩවි ලෝක උරුම ලෙස නම් කළේය. ජීව විවිධත්වය සහ වඳවී යන සතුන්ගේ පැවැත්ම එයට හේතු කාරක විය. දැනට මේ කුඩා දිවයින සතු ලෝක උරුම ගණන 10 යකි. නීති විරෝධී ලෙස කැළෑ කැපීම, සතුන් දඩයම් කිරීම, නිවෙස් සහ මාර්ග ඉදිකිරීම වැනි ක්‍රියාවන් සතුන්ගේ පැවැත්මට තර්ජනයක් වී ඇත.

අප මුහුණ පා ඇති තවත් ප්‍රබලම අභියෝගයක් වන්නේ ජාන කොල්ලයයි. අපට උරුම දේශීය ජෛව සම්පත් සහ දැනුම නීති විරෝධි ලෙස රටින් පිට කිරීම මොන තරම් අපරාධයක්ද? එය දඬුවම් ලැබිය යුතු කොල්ලකෑමකි. අපෙන් කොල්ලකා ගත් සම්පත්වලින් විදේශ රටවල ඖෂධ නිපදවා, හිමිකම් බල පත්‍ර ඔවුන් ලබා ගනී. පසුව එම ඖෂධ අපට අධික මිලකට අලෙවි කරයි. මෙය කොතරම් අසාධාරණද?

ශ්‍රී ලංකාවට ආවේණික පැළෑටි සහ සතුන් බොහොමයක් වඳවීමේ තර්ජනයට ලක් වී ඇත. සමහර මිරි දිය මාලු, උරගයන් සහ උභය ජීවීන් දැනටමත් රතු ලේබලයට අයත්ය. එසේ තිබියදීත් සංරක්ෂිතයන්හි කෘමීන් සහ පැළෑටි සොරෙන් එකතු කළ විදේශිකයින් රැසක්, නීතියේ රැහැණට හසු විය. විවිධ සතුන් හා පැළෑටි රහසේ රටින් පිට කිරීමට තැත් කළ දේශීය සහ විදේශික පිරිස් මෑතකදී රේගුවට කොටු විය.

බොහෝ අවස්ථාවල අපේ උරුමයන් රැක ගැනීමට සිදුවී ඇත්තේ අපේ අය ගෙන්මය. සිදුවන විනාශයන්ට ඔවුන් වගකිව යුතු වේ. එ පමණක් නොව, විදේශිකයන්ට ජාන කොල්ලය වැනි නීති විරෝධි ක්‍රියාවලට ඔවුහු උදවු දෙති. මෙම තත්ත්වය මර්දනය කිරීමට නව තාක්ෂණය යොදා ගනිමින් ආරක්ෂිත ප්‍රදේශ පිළිබඳව සුපරික්ෂාකාරීවීමට පියවර ගත යුතුය. පරිසරහිතකාමී ස්වේච්ඡා කණ්ඩායම්වලට මේ ප්‍රදේශවල සිදුවන සැක සහිත ක්‍රියාවන් වාර්තා කිරීමට දිරි ගැන්විය යුතුය. වරද කරුවන්ට දඬුවම් දීමට තද නීති පැනවිය යුතුය.

QUESTIONS

**Marks**

(a) Identify the reasons why UNESCO named three new World Heritage sites in Sri Lanka in 2010. **2**

(b) What is 'gene piracy' and how has it affected Sri Lanka? **2**

(c) According to the reporter, who is mainly to blame for the destruction of Sri Lanka's natural heritage? How does the reporter justify his conclusion? **3**

(d) According to the reporter, what steps should be taken to protect the natural resources of Sri Lanka? **3**

**Part B** (Question 9)
(10 marks)

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of a text by identifying, analysing, and responding to information;*
- *convey information coherently (structure, sequence, accuracy and variety of vocabulary and sentence structure) and appropriately (relevance, use of conventions of the text type).*

9. Read the text and then answer the question in 150–200 words in SINHALA on page 7.

**සිසුන් සඳහා දින 8 ක චාරිකා පැකේජයක්**
**ශ්‍රී ලංකාවේ වැදගත් සහ දර්ශනීය ස්ථාන නැරඹීමට**
**සියලු පහසුකම් සහිතයි.**
**අයකිරීම $750 ක් පමණයි**

චාරිකා විස්තරය.

1. පෙ.ව. 8.00 ට කොටුව දුම්රියපළෙන් ගමන් ආරම්භ කර විල්පත්තු අභය භූමියට පැමිණීම. සවස සෆාරි චාරිකාව.
2. අනුරාධපුරය - ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය ඇතුලු සියලු සිද්ධස්ථාන, ඓතිහාසික නටබුන් සහ වැව් නැරඹීම.
3. ත්‍රිකුණාමලය - ස්වභාවික වරාය හා හින්දු කෝවිල නැරඹීම. නිලාවේලි වෙරළේ විනෝදවීම සහ බෝට්ටු සවාරිය.
4. සීගිරිය - ගල මුදුනට නැග බිතු සිතුවම් නැරඹීම, දඹුල්ල ලෙන් චිත්‍ර සහ පිළිම ගෙවල් නැරඹීම, මාතලේ කුළු බඩු උයන් හරහා මහනුවරට ළඟාවීම.
5. මහනුවර - දළදා මාළිගාව, කෞතුකාගාරය, උද්භිද උද්‍යාන සහ සංස්කෘතික සංදර්ශනය නැරඹීම, තේ වතු හරහා නුවර-එළිය කරා ළඟාවීම.
6. නුවර-එළිය - මල් වත්ත හා අවට සෞන්දර්ය නැරඹමින් කිතුල්ගලට ළඟාවීම.
7. කිතුල්ගල - විනෝද උයනේ ක්‍රීඩාවල යෙදීම, කඳු නැගීම, ඔරු පැදීම වැනි ක්‍රියා කාරකම්වල යෙදීම.
8. කොළඹට පැමිණීම - නගරයේ සංචාරය කර සාප්පු සවාරියකින් පසුව සවස ප.ව. 6.00 ට කොටුව දුම්රියපළට ඇරලීම.

ඉක්මන් කරන්න! අදම වෙන්කරවා ගන්න!
විමසන්න හිරාන් ට්‍රැවල්ස්
දුරකතන 9755 0432

QUESTION

You have participated in a similar tour. Write the text of a speech, in 150–200 words in Sinhala, for the Sinhala Language School student meeting, to persuade your friends to join up for this tour after the examinations.

ඔබ මීට සමාන චාරිකාවකට කලින් සහභාගි වී ඇත. විභාගයෙන් පසුව ඔබේ මිතුරන්ව ද මෙම චාරිකාවට එක් කරවීමට පෙළඹවීම සඳහා, සිංහල භාෂා පාසලේ සිසු රැස්වීමේදී පැවැත්වීමට වචන 150-200 අතර කතා පිටපතක් සිංහලෙන් ලියන්න.

*Do not remove this page from the question booklet.*

| Student/Registration Number | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

Sinhala Continuers Level

| Centre Number | | | | | | |
|---|---|---|---|---|---|---|

Question 9



PLEASE TURN OVER

**End of Section 2**

Student/Registration Number | | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2011 PUBLIC EXAMINATION

# Sinhala

## Continuers Level

### Section 3: Writing in Sinhala (15 marks)

**Instructions to Students**

1. Allow approximately 45 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2011

**Section 3** (Questions 10–13)
(15 marks)

---

*When judging performance in this section, the examiner(s) will take into account the extent to which the student demonstrates:*

- *relevance and depth of treatment of ideas, information, or opinions;*
- *accuracy and range of vocabulary and sentence structures;*
- *the capacity to structure and sequence response and capacity to use conventions of the text type.*

---

Answer ONE question from this section in 200–250 words in SINHALA.

10. ‘Most television advertisements about consumer goods mislead viewers.’ Write an evaluative article for your school magazine giving the strengths and the weaknesses of this statement.

    “රූපවාහිනියේ පෙන්වන බොහෝ පාරිභෝගික භාණ්ඩ පිළිබඳ දැන්වීම්, නරඹන්නන් නොමඟ යවයි”. මෙම ප්‍රකාශයේ සත්‍යතාව හා දුර්වලකම් ඇගයීමට ලක් කරමින් පාසල් සඟරාවට ලිපියක් ලියන්න.

11. Write a report, to be published in a local Sinhala community newspaper, based on your personal experiences about your participation in the ‘Clean Up Australia’ campaign.

    ‘ඕස්ට්‍රේලියාව පිරිසිදු කරමු’ ව්‍යාපාරය සඳහා සහභාගි වීමෙන් ඔබ ලැබූ පුද්ගලික අත්දැකීම් පදනම් කර ගෙන වික්ටෝරියාවේ සිංහල ප්‍රජා පුවත්පතක පළ කිරීමට වාර්තාවක් ලියන්න.

12. One of your friends in Sri Lanka has asked you for information about school education and extracurricular activities in Australia. Write a letter in response to your friend’s request for information.

    ශ්‍රී ලංකාවේ වෙසෙන ඔබේ මිතුරෙක්/මිතුරියක්, ඕස්ට්‍රේලියාවේ පාසල් අධ්‍යාපනය සහ විෂය බාහිර ක්‍රියාකාරකම් පිළිබඳව ඔබෙන් විස්තර අසා එවා ඇත. මිතුරාට/මිතුරියට පිළිතුරු වශයෙන් අසා ඇති කරුණු විස්තර කරමින් ලිපියක් ලියන්න.

13. Write an imaginative short story to be published in the *Tharuna* newspaper on the topic ‘Dreams do come true’.

    ‘හීන සැබෑ වෙනවා’ යන මාතෘකාව යටතේ මනඃකල්පිත කෙටි කතාවක් ‘තරුණ’ පුවත් පතට ලියන්න.

You may make notes in this space.

Question Number:

**End of Section 3**